**වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 29 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශනව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

**(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**-----------------------------------------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් නොවූ රු.3,242,600ක ඉඩම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | නඩුව තවමත් අධිකරණයේ විභාගයට ගෙන නොමැත. | අයිති නොවූ ඉඩම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම වැලැක්වීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) සුසානභූමි 10ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි කාලයේදි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 16 (2)උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදි ඉදිරිපත් කරනු ලැබේ. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 126 iii (ඊ) වගන්තිය | රු.158,157 ක් වටිනා අවසර නොලත් දැන්වීම් 41 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගාස්තු නොගෙවූ ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ලිපි යවා ඇත. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. |
| | 158(1) වගන්තිය | හිඟ වරිපනම් බදු රු.21,241,919ක් ගෙවීම පැහැරහරින්නන්ට වරෙන්තු නිකුත් කර නොතිබුණි. | හිඟමුදල් අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතියේ X පරිශිෂ්ඨයේ 193 වගන්තිය | තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර අයවැය සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් වාර්තා පිළියෙල කර නොතිබුණි. | ඉදිරි කාලයේදි අමුණා යැවීමට කටයුතු කරනු ලැබේ. | අදාළ රීතින් අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | ටිපර් කුලි වෙනුවෙන් 2018 වර්ෂයේ ගෙවන ලද අත්තිකාරම් රු.600,000 ක් මේ දක්වා නිරවුල් කර නොතිබුණි. | විමර්ශන වාර්තාව ලැබූ විගස නිරවුල් කරනු ලැබේ. | නියමිත රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018.01.24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | සේවකයින්ට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට අඩුනොවන පුහුණුවක් ලබාදුන් බවට තහවුරු කළ නොහැකිව පැවැතුණි. | පුහුණුවීම් ලබාදීමට ප්‍රවර්තන වර්ෂයේ කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඊ) | අනෙකුත් චක්‍රලේඛ 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන - 01 දරන පළාත්පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දී නොතිබුණි. | ගෞරව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් සේවාවන් සැපයීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.132,421,533ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 69,101,854 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 14,063,700 | 14,884,570 | 24,459,838 | 14,118,700 | 14,936,876 | 20,698,175 |
| කුලී | 45,022,800 | 44,783,099 | 1,863,071 | 43,696,800 | 42,860,188 | 2,329,771 |
| බලපත්‍ර ගාස්තු | 4,780,000 | 9,790,162 | - | 4,978,000 | 2,896,341 | - |
| වෙනත් ආදායම් | 101,808,205 | 143,597,228 | 23,641,768 | 94,606,854 | 85,319,492 | 18,431,747 |
| | 165,674,705 | 213,055,059 | 49,964,677 | 157,400,354 | 146,012,897 | 41,459,693 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ හිඟ වරිපනම් බදු රු. 21, 241,919 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ආදායම් එකතු කරන නිලධාරීන් අයකර ගැනීමට කටයුතු කර ඇත. | හිඟ වරිපනම් බදු මුදල් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) හිඟ කඩ කුලී රු.168,470 ක් අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟ කඩ කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) හිඟ බදුකුලී රු.1,620,526ක් අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කපා හැරීමට ගෞරව ආණ්ඩුකාරවරයාගෙන් අනුමැතිය ඉල්ලා ඇත. | හිඟ බදුකුලී අයකිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

**2.2.4 මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු. 18,431,747 ක් ලැබිය යුතුව තිබුණි. | මේ දක්වා පළාත් භාණ්ඩාගාරයට ලැබී නොතිබුණි. | මුද්දර ගාස්තු නියමිත කාලයේ අයකර ගැනීමට සුදුසු පියවර ගතයුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුහසාධනය ආදි කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වු කරුණු පහත සඳහන් පරිදි විය. සභාව විසින්

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් 30ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | මින් ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු ලැබේ. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### (ආ) කාර්යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.11,358,341ක වියදමින් ක්‍රියාකාරකම් 05ක් ගිවිසුම් කාලය අවසන්වී මාස 03ක් ඉක්මගොස් තිබු නමුත් නිමකර නොතිබුණි. | කාර්යයන් ක්‍රියාත්මක වෙමින් පවතී. | කොන්ත්‍රාත් කාර්යයන් නියමිත කාලයේ අවසන් කිරීමට කටයුතු කළ යුතුවේ. |

### (ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවෘත වාහනවලින් කසළ රැස්කරන බැවින් මාර්ගයේ ගමන් කරන ජනතාවට සෞඛ්‍ය ගැටළු මතු වී තිබූ අතර මාර්ගය දිගේ කසළ වැටී තිබුණි. | දැල් භාවිතා කිරීමට කටයුතු කර ඇත. | ආවරණය කළ වාහන භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. |

### (ඇ) පාරිසරික ගැටළු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සඳහා කිසිඳු මෙවලමක් නිර්දේශ කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අනුව ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ii) | බන්ධනාගාර ප්‍රතිසංස්කරණය පුනරුත්ථාපනය සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශ අරමුදල් ප්‍රතිපාදනයෙන් 2016 වර්ෂයේ සිට ඉදිකරමින් පැවැති මල අපද්‍රව්‍ය පිරිපහදු මධ්‍යස්ථාන ඉදිකිරීම් කාර්යයන් මේ දක්වාම නිම නොකර පැවැති නිසා සභා බල ප්‍රදේශය තුළ පවතින මලඅපද්‍රව්‍ය පිරිපහදු කළ නොහැකි තත්ත්වයක් උද්ගතව තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ මලඅපද්‍රව්‍ය පිරිපහදු ව්‍යාපෘතිය අප වෙත භාරදී නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අනුව ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පළාත් පාලන සහකාරු විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රදේශයට අදාල මූලික කාර්යයන් ඉටු කර නොතිබුණි. | නියමිත වාර්තා සකස්කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | වෙනත් දෙපාර්තමේන්තුවල නිර්දේශ නියමිත කාලයේ නොලැබීම නිසා සේවාවන් කාල ප්‍රමාදයක් සහිතව ඉටුකර තිබුණි. | මහජනවට සැලසිය යුතු සේවාවන් නියමිත කාලයේ සැලසීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුවල පැවැති අරමුදල් රු.241,147,508ක් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොකර බැංකුවේ පොළී ඉපැයීමේ අරමුණින් තැන්පත් කර තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ස්ථාවර තැන්පතු නිදහස් කරගැනීම සිදුකෙරේ. | සංවර්ධන කාර්යයන් නියමිත කාලයේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි අයදුම්පත්‍ර 95කට අනුමැතිය ලබාදී නොතිබුණි. | වෙනත් දෙපාර්තමේන්තුවල නිර්දේශ නියමිත කාලයේ නොලැබීම නිසා ප්‍රමාදවීම් සිදුවේ. | නියමිත කාලයේ ගොඩනැගිලි අයදුම්පත්‍ර අනුමැතින් ලබාදීමට පියවර ගත යුතුවේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 19 ක් විසින් ඉටු කළයුතු සේවාවන් ප්‍රමාදවී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | සුදුසු කටයුතු සිදු කෙරේ. | නියමිත කාලයේ තනතුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දේපල හිමියන් 21,209දෙනෙකුට "K" ආකෘති පත්‍ර නිකුත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම දෝෂ නිවැරදි කරනු ලැබේ. | පනත ප්‍රකාරව සුදුසු පියවර ගත යුතු වේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ භාවිතයේ පවතින වාහන 06 ක් මේ දක්වා සභාවේ නමට අයිතිය මාරු කිරිමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය මාරු කිරිම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. | වාහනවල අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.5.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උප කාර්යාල දෙකක පොත් 228 ක් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | අඩුපාඩු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් සහ තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වීමෙන්, මෙය වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතායක් ලෙස අනාවරණය වි තිබුණි. | මියගිය අයගේ විශ්‍රම පාරිතෝෂික අඩුවීම නිසා වියදම් අඩුවී තිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කළ යුතු වේ. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන වාර්තා නියමිත කාලපරිච්ඡේදයේ සකස් කර නොතිබුණි. | ඉදිරි කාලයේදි මෙම දෝෂය නිවැරදි කරනු ලැබේ. | අභ්‍යන්තර විගණන වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. |